අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/09/12/02/01

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2021.06.16

චක්‍රලේඛ අංක : 11/2021

සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කොට්ඨාශ භාර නියෝජ්‍ය /සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම විදුහල්පතිවරුන්,

**අ.පො.ස.(උසස් පෙළ ) විෂය ධාරාවට කොරියන් භාෂාව ඇතුළත් කිරීම**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විෂය මාලාව සඳහා 2015 වර්ෂයේ දී කොරියන් භාෂාව ඇතුළත් කර ඇති අතර, විදේශීය භාෂාවක් ලෙස හැදෑරීමේ අවස්ථා තව දුරටත් පුළුල් කිරීම උදෙසා ඒ විෂයය අ.පො.ස.(උසස් පෙළ ) විෂය ධාරාවට ද ඇතුළත් කිරීම කාලීන අවශ්‍යතාවක් වේ.

2.0 ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ නිර්දේශය මත අ.පො.ස.(උසස් පෙළ ) විෂය ධාරාව සඳහා හඳුන්වා දෙනු ලබන කොරියන් භාෂාව සම්බන්ධයෙන් මෙම චක්‍රලේඛයේ උපදෙස් මින් ඉදිරියට බල පැවැත්වෙනු ඇත.

3.0 අ.පො.ස.(උසස් පෙළ) විෂය ධාරාවට 2021 වර්ෂයේ සිට කලා විෂය ධාරාවේ භාෂා කාණ්ඩයේ උප විෂයයක් ලෙස කොරියන් භාෂාව ඇතුළත් කරනු ලැබේ.එනම්, ''අ.පො.ස. (උසස් පෙළ ) විෂය සංයෝජන හා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා වූ විෂය සංයෝජන '' පිළිබඳ චක්‍රලේඛ අංක 2016/13 හා 2016.04.26 දිනැති අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛයෙ හි 5.1.6. කලා විෂය ධාරාව සඳහා විෂයය කාණ්ඩයෙහි (ඇ) භාෂා විෂයයන් හි අනු අංක 3 යටතේ ඇතුළත් විෂයයන්ට අමතරව කොරියන් භාෂාව විෂයය ද ඇතුළත් කෙරේ.

4.0 එම විෂයට අදාළ විෂය නිර්දේශ හා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ ජාතික අධ්‍යාපන ආයතනය මඟින් සම්පාදනය කරනු ලබන අතර, ගුරු පුහුණුව ද එම ආයතනය මඟින් සිදු කරනු ලැබේ.

5.0 2021 අධ්‍යයන වර්ෂයේ අ.පො.ස.(උසස් පෙළ ) සඳහා 12 ශ්‍රේණියට ඇතුළත් වන සිසු සිසුවියන්ට 2021/2023 අධ්‍යයන වර්ෂවල විෂය නිර්දේශ ක්‍රියාත්මක කිරීමෙන් පසුව අ.පො.ස.(උසස් පෙළ) විභාගයේ දී ප්‍රථම වරට කොරියන් භාෂාව සඳහා පෙනී සිටීමට අවස්ථාව හිමිවේ.

6.0 අ.පො.ස.(උසස් පෙළ) විෂය සංයෝජන හා විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා වූ විෂය සංයෝජන පිළිබඳ අධ්‍යාපන අමාත්‍යාංශ 2016.04.26 දිනැති 2016/13 චක්‍රලේඛය ඉදිරියේදී සංශෝධනය කිරීමට නියමිතය.

ඒ අනුව අ.පො.ස.(උසස් පෙළ ) කොරියන් භාෂාව සම්බන්ධයෙන් අදාළ පාර්ශවයන් දැනුවත් කර ඉදිරි කටයුතු සිදු කරන ලෙස මෙයින් දන්වමි.

මහාචාර්ය කේ.කපිල සී.කේ.පෙරේරා
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත්:
01. සභාපති , විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
02. සභාපති, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
03. සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
04. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය
05. විභාග කොමසාරිස් ජනරාල් ,ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
06. [illegible]